| කැලණිය අධ්‍යාපන කලාපය |
|---|
| දෙවන වාර පරීක්ෂණය - 2017 |

| 11 ශ්‍රේණිය | නර්තනය I , II | කාලය පැය 03 |
|---|---|---|

නම : ..............................................................................................

1 කොටස

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
නිවැරදි පිළිතුර තෝරා ලකුණු කරන්න.

01. "ශ්‍රම" නැමති ස්ථායි භාවයෙන් උපදින රසය නම්,
1. ශෘංගාර 2. කරුණා 3. ශාන්ත 4. වීර

02. හටන් කවි භාවිත කරනුයේ,
1. මෝල්ගස් නැටුම් සඳහා 2. ලී කෙලි නැටුම් සඳහා
3. කළගෙඩි නැටුම් සඳහා 4. කඩු නැටුම් සඳහා

03. කාන්තාවන් විසින් පමණක් ඉදිරිපත් කරනු ලබන ගැමි නැටුම් විශේෂයකි,
1. ලීකෙලි 2. මෝල්ගස් 3. උඩැක්කි 4. කඩු

04. තාන්ඩව ලක්ෂණ සහිත චලන භාවිත කරනුයේ,
1. කළගෙඩි නැටුම් සඳහා 2. මෝල් ගස් නැටුම් සඳහා
3. කුළු නැටුම් සඳහා 4. කඩු නැටුම් සඳහා

05. රන්විලි දෙකොනට තබා සකසා ඇති උපකරණය වන්නේ,
1. කඩුව 2. චාමර 3. මෝල්ගස් 4. ලී

06. 12 වන ගොඩ සරඹය හඳුන්වනු ලබන්නේ,
1. අර්ධ චක්‍ර සරඹය නමිනි 2. බඹර සරඹය නමිනි
3. පැනීමේ සරඹය නමිනි 4. චන්ද්‍රිකා සරඹය නමිනි

07. "තකට තකට තක තරිකිට කුද කුද /// ගජිං " මෙම කස්තිරම නටා අවසන් කරනුයේ,
1. 9 වන ගොඩ සරඹයයි 2. 10 වන ගොඩ සරඹයයි
3. 11 වන ගොඩ සරඹයයි 4. 12 වන ගොඩ සරඹයයි

08. "දොං දොංත තකු දොං" මෙම බෙර පදය භාවිත කරනුයේ,
1. තුරඟා වන්නමට 2. සැවුලා වන්නමට 3. මුසලඩි වන්නමට 4. සිංහරාජ වන්නමට

09. "තකු තක තරිකිට කුංදත් ගජ්ජිත් තක ජිත් කුංදත් තකුතක තරිකිට කුංදත් දොංතා"
1. සැවුලා වන්නමට අයත් සීරුමාරුවයි 2. සැවුලා වන්නමට අයත් අඩව්වයි
3. මුසලඩි වන්නමට අයත් සීරුමාරුවයි 4. මුසලඩි වන්නමට අයත් අඩව්වයි

10. මාත්‍රා 2 +2 +4 තාල රූපය හඳුන්වනු ලබන්නේ,

1. දෙසුළු මහා තුන්තිත නමිනි
2. දෙසුළු මැදුම් තුන්තිත නමිනි
3. සුළු මහා දෙතිත නමිනි
4. සුළු මැදුම් දෙතිත නමිනි

11. "කුදංත ගතදොං " වට්ටම නටනු ලබන තාලරූපය වන්නේ,

1. මාත්‍රා 2+ 3 දෙතිත
2. මාත්‍රා 2 +4 දෙතිත
3. මාත්‍රා 2 + 2 +4 තුන්තිත
4. මාත්‍රා 2 + 2 +3 තුන්තිත

12. මාත්‍රා 2 + 2 + 3 තාල රූපය අනුව තාලම්පට වාදනය කිරීම සංකේත මගින් දක්වනුයේ,

1. /, ʌ , ʌ
2. /, /, ʌ
3. ʌ , ʌ, /
4. ʌ , /, ʌ

13. විලම්භ මධ්‍ය, ධෘත නම් ත්‍රිවිධ ලය මෙනමින් ද හැඳින්වේ.

1. සමගුණ දෙගුණ සිව්ගුණ
2. සමගුණ, දෙගුණ, තුන්ගුණ
3. දෙගුණ, තුන්ගුණ, සිව්ගුණ
4. සමගුණ, තුන්ගුණ, සිව්ගුණ

14. උඩරට කවිකාර මඩුවෙහි ගැයූ ගායනා විශේෂයකි,

1. ප්‍රශස්ති කවි
2. ග්‍රහපන්ති කවි
3. ටීකා සීපද
4. ශ්ලෝක

15. අපල උපද්‍රව දුරු කිරීම සඳහා ගයනු ලබන්නේ,

1. ටීකා සීපද
2. ප්‍රශස්ති
3. වන්නම්
4. ග්‍රහපන්ති කවි

16. පිරිසක් එකතුව වාදනය කරනු ලබන අවනද්ධ භාණ්ඩයකි,

1. තාලම්පට
2. බංකුරබාන
3. දවුල
4. පන්තේරුව

17. උඩරට නර්තන සම්ප්‍රදායට අයත් වන්නම් දෙකකි,

1. මුසලඩි , කොවුලා
2. විරාඩි, කොවුලා
3. සිංහරාජ, මුසලඩි
4. කදම්භපක්ෂි, සිංහරාජ

18. "නොනැවත්ත යනු නැත එතනින්...." මෙම කවියේ ඊලඟ කවි පදය වන්නේ,

1. කලත් වසන තැනින් දුවන
2. පැන අඩි පත්රාඩි බුදමින්
3. හිරුත් අවර ගිරත් පැමිණි
4. විටත් ඔවුන තුටත් සිටින

19. නර්තන කලාවේ නූතන ප්‍රවණතාවයකි

1. නූතන තාක්ෂණ භාවිතය අවම වීම
2. අධ්‍යාපන අවස්ථා වර්ධනය වීම
3. සමාජීය අවශ්‍යතා සඳහා නර්තන යොදා නොගැනීම
4. වෘත්තිය ශිල්පීන් බිහි නොවීම

20. උඩරට බෙර වාදනය පුහුණුවීමේදී භාවිත වන දෙවන බෙර සරඹය වන්නේ,

1. තකට
2. තකට තකට කුද
3. තකට කුදට
4. තකට කුදට තක

21. මෙම රූපයෙන් දක්වෙන්නේ,

1. කෝලම් මුහුණකි
2. සොකරි මුහුණකි
3. සන්නි මුහුණකි
4. රූකඩ මුහුණකි



22. මෙම රූපයෙන් දක්වෙන රංගභූමිය හඳුන්වන්නේ,
1. කමත
2. කරලිය
3. සබය හෙවත් තානායම් පොල
4. පින්තූර රාමු වේදිකාව



23. බෙරවාදනය පුහුණුවීමේදී අප පළමුව කළ යුත්තේ,
1. අක්ෂර වාදනය හඳුනා ගැනීම
2. ලය අනුව බෙර පද වාදනය
3. බෙර සරඹ වාදනය
4. ගායනය අනුව වාදනය

24. වන්නම් පිළිබඳ තොරතුරු සඳහන් ග්‍රන්ථයකි,
1. සද්ධර්මරත්නාවලිය 2. වාදංකුස රත්නමාලය 3. එරන්දතී වර්ණනාව 4. කලගෙඩි මාලය

25. 1972 වසරේ ආරම්භ කරන ලද නර්තන අධ්‍යාපනය හා සම්බන්ධ වැදගත් ආයතනයකි,
1. සෞන්දර්ය විශ්ව විද්‍යාලය
2. ජනකලා කේන්ද්‍රය
3. හිරාගම සෞන්දර්ය ගුරු විදුහල
4. උඩරට නර්තන ශිල්ප සභාව

26. අංග රචනය සඳහා භාවිතයට ගන්නා උපකරණයක් නොවන්නේ,
1. පින්සල් 2. පැන්සල් 3. සිලම්බු 4. කන්නාඩිය

27. දක්ෂිණ භාරතයේ කේරල ප්‍රාන්තයේ ප්‍රචලිත නර්තන සම්ප්‍රදාය නම්,
1. කථක් 2. මනිපුරි 3. භරත 4. කතකලි

28. අංග , ප්‍රත්‍යාංග හා උපාංග මගින් අදහස් ප්‍රකාශ කිරීම,
1. වාචික අභිනයයි 2. ආංගික අභිනයයි 3. සාත්වික අභිනයයි 4. ආහාර්ය අභිනයයි

29. දේශීය නර්තන සම්ප්‍රදායන් තුනටම පොදු වූ ශාන්තිකර්මය වන්නේ,
1. බලිශාන්තිකර්මය 2. රට යකුම 3. දෙවොල් මඩුව 4. පහන් මඩුව

30. "වන පැත්ත බිය පත්ව සයනම්," මෙම කවිපදයේ ලඝු හා ගුරු අක්ෂර ගණන,
1. ලඝු 08 ගුරු 03 කි 2. ලඝු 09 ගුරු 03 කි
3. ලඝු 08 ගුරු 02 කි 4. ලඝු 03 ගුරු 08 කි

අංක 31 සිට 35 දක්වා පහත වගුව භාවිතයෙන් පිළිතුරු සපයන්න.

| පේළිය | A තීරුව | B තීරුව | C තීරුව |
|---|---|---|---|
| 1 | දේවකෝල් පාඩුව | අත්මිණිය | තෙල්මෙ |
| 2 | යක්බෙරය | අම්බලන්ගොඩ | රන්තපුරය |
| 3 | මහනුවර | අස්නෙ | ගැටබෙරය |

31. උඩරට නර්තන සම්ප්‍රදායට අයත් නර්තන අංගයක් සඳහන් වන්නේ,
1. 1 පේළියේ A තීරුවේ 2. 1 පේළියේ C තීරුවේ
3. 3 පේළියේ B තීරුවේ 4. 1 පේළියේ A හා B තීරුවල

32. බලි ශාන්ති කර්මය සඳහා භාවිත ලෝහමය භාණ්ඩය ඇතුලත් වන්නේ,
1. 1 පේළියේ B තීරුවේ
2. 2 පේළියේ A තීරුවේ
3. 3 පේළියේ C තීරුවේ
4. 1 පේළියේ C තීරුවල

33. "තත් ජිත් තොං නං" යන සතර බීජාක්ෂර වාදනය කරනු ලබන වාද්‍ය භාණ්ඩය දක්නට ලැබෙන්නේ,
1. 1 පේළියේ B තීරුවේ
2. 2 පේළියේ A තීරුවේ
3. 3 පේළියේ C තීරුවේ
4. 1 පේළියේ A තීරුවල

34. සබරගමු නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශයක් සඳහන් වන්නේ,
1. 1 පේළියේ A තීරුවේ
2. 2 පේළියේ B තීරුවේ
3. 2 පේළියේ C තීරුවේ
4. 2 පේළියේ B හා C තීරුවල

35. වන්නම් රචනා වූ යැයි සැළකෙන යුගය සඳහන් වන්නේ,
1. 2 පේළියේ B තීරුවේ
2. 2 පේළියේ C තීරුවේ
3. 1 පේළියේ A තීරුවේ
4. 3 පේළියේ A තීරුවේ

36. සංස්කෘත භාෂාවේ වචන බොහෝ සේ දක්නට ලැබෙන ගායනා විශේෂයකි,
1. නෙළුම් කවි 2. ප්‍රශස්ති 3. රබන් 4. චාමර

37. යුධමය අවස්ථා වල දී භාවිතා වුයේ,
1. වද බෙර 2. මල බෙර 3. රණ බෙර 4. මඟුල් බෙර

38. අනාඝාතාත්මක ගායන විලාසයකි,

1. රබන් කවි 2. නමස්කාර ගාථා 3. චාමරකවි 4. ඔන්චිලිවාරම්

39. ධීවර ජනජීවිතය තේමා කරගත් මුද්‍රා නාට්‍යයකි.

1. කරදිය 2. චන්ඩාලිකා 3. සත්පත්තිනි 4. සැලලිහිණිය

40. අත්‍යා බෙර වාදනය දක්නට ලැබෙන්නේ,
1. පහතරට නර්තන සම්ප්‍රදායේ දී
2. උඩරට නර්තන සම්ප්‍රදායේ දී
3. සබරගමු නර්තන සම්ප්‍රදායේ දී
4. කථකලි නර්තන සම්ප්‍රදායේ දී

## II කොටස

<u>පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.</u>

01. 1. උඩරට නර්තන සම්ප්‍රදායෙහි හස්ත පාද හැසිරවීමේ මූලික සරඹ විශේෂය .............................. නමින් හැඳින්වේ.

2. කතකලි නර්තන සම්ප්‍රදාය ............................... විසින් නිර්මාණය කරන ලදී.

3. ''යුද්දෙටත් ඇවිත් සිදුපිට'' .මෙය..................................... කවියකි

4. ............................ වන්නම මාත්‍රා 3 + 4 දෙතිතට හා කොටසක් මාත්‍රා 3 +3 තනිතිතට නැටීම සුවිශේෂ ලක්ෂණයකි.

5. උඩරට වන්නමක අඩව්ව නැටීමට පෙර ........................... නටනු ලැබේ.

6. දොං දොංජිං ජිංගජි ගත මෙය .................................. දෙතිතට අයත් බෙරපදයකි

7. මිනිස් චරිත සත්ව චරිත හා අතිමානුෂ චරිත ..................... ගැමි නාටකයේ දක්නට ලැබේ.

8. <u>සිරිවස</u> ගෙන අසු නැගෙමින් නොලසා'' මෙම ග්‍රහපන්ති කවියෙහි සිරිවස යනුවෙන් හඳුන්වන්නේ ............................................ යි

9. ................................ හා ............................... ගේ දේශාටන වාර්තා මගින් මහනුවර යුගයේ පැවති මෙරට නර්තන කලාව පිළිබඳ තොරතුරු හමුවේ.

10. නර්තන අධ්‍යාපනයේ ප්‍රවර්ධනය සඳහා ......................................මහත්මියගේ දායකත්වය හිමි වූ අතර මුද්‍රා නාට්‍ය ක්ෂේත්‍රයට විශාල දායකත්වයක් ................................... මහත්මිය විසින් ලබාදෙන ලදී. (ල 12)

02. 1. තුන්තිතේ ප්‍රභේද 02 ක් නම් කරන්න (ල 2)

2. මාත්‍රා 2 + 3 තාලරූපයට අයත් බෙරපදයක් ප්‍රස්තාර ගත කරන්න. (ල 4)

3. මාත්‍රා 3 + 4 තාලරූපයට අයත් කස්තිරමක් ප්‍රස්තාර ගත කරන්න (ල 6)

03. 1. කඩු හෝ මෝල්ගස් නැටුමේ සුවිශේෂ ලක්ෂණ 02ක් ලියන්න. (ල 2)

2. මෝල්ගස් නැටුම සඳහා භාවිත කවියක් ලියන්න. (ල 4)

3. ගැමි නැටුමක් නිර්මාණය කිරීමේදී අවධානය යොමුකල යුතු කරුණු 03ක් විස්තර කරන්න (ල 6)

04. 1. නර්තන කලාව පිළිබඳ ඓතිහාසික තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍ර 02ක් නම් කරන්න (ල 2)

2. 1970 වර්ෂයෙන් පසු නර්තන අධ්‍යාපනයේ ඇති වූ නව ප්‍රවනතා දෙකක් කෙටියෙන් විස්තර කරන්න (ල 4)

3. නර්තන නිර්මාණයේදී ප්‍රාසංගික බව හා විවිධාංගීකරණය සඳහා භාවිත වන තාක්ෂණ උපක්‍රම 03ක් සඳහන් කර භාවිත කරන ආකාරය පැහැදිලි කරන්න. (ල 6)

05. 1. කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ පුද ලබන දෙවිවරු 02ක් සඳහන් කරන්න (ල 2)

2. ඔබ උගත් ශාන්තිකර්මයක චාරිත්‍ර විධි 02ක් නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ල 4)

3. ශාන්තිකර්ම හා සම්බන්ධ කතා පුවත් තුලින් සමාජයට ලබාදෙන යහපත් ආකල්ප පිළිබඳව එක් කතා පුවතක් ඇසුරෙන් විමසීමට ලක් කරන්න (ල 6)

06. 1. කතකලි නර්තන සම්ප්‍රදාය උගන්වන ආයතනය නම් කරන්න (ල 2)

2. කතකලි නර්තනය සඳහා භාවිත සංගීත සම්ප්‍රදාය හා වාද්‍ය භාණ්ඩ පිළිබඳ කෙටි විස්තරයක් කරන්න (ල 4)

3. කතකලි නර්තන සම්ප්‍රදාය ආහාර්ය අභිනයෙන් පොහොසත්ය, විමසුමට ලක් කරන්න. (ල 6)

07. 1. රූපවාහිනියේ විකාශනය වන ළමා නර්තන වැඩසටහන් 02ක් නම් කරන්න (ල 2)

2. එම වැඩසටහන් තුලින් නැරඹූ නර්තන අංග 02ක් කෙටියෙන් විස්තර කරන්න. (ල 4)

3. නර්තන අංග විචිත්‍රවත් කිරීමට යොදා ගෙන ඇති ක්‍රමවේද පිළිබඳ විස්තරයක් කරන්න. (ල 6)